3.8 බෙල්ලන්විල පරිශ්‍රයෙහි පවතින අනෙකුත් වෙළඳ කුටිවල විකිණීම සඳහා අවසර ලබා දී ඇති ආහාර පාන වර්ග සහ අනෙකුත් තොරතුරු පහත පරිදි වේ.

| වෙළඳ කුටි අංකය | වෙළඳ කුටියේ නම | අවසර ලත් ආහාර/පාන අයිතම වර්ග |
|---|---|---|
| ආහාර පාන වෙළඳ කුටි අංක - 02 | අයිස්ක්‍රීම් කෝනර් | අයිස්ක්‍රීම්, පලතුරු සලාද, සිසිල් බීම |
| ආහාර පාන වෙළඳ කුටි අංක - 03 | ජූස් ඇන්ඩ් ස්මූති බාර් | නැවුම් පලතුරු යුෂ, සෞඛ්‍ය සම්පන්න පාන වර්ග , ෆලූඩා සහ ස්මූති ආදිය |
| ආහාර පාන වෙළඳ කුටි අංක - 04 | චයිනීස් කෝනර් | තායි සහ චයිනීස් කෑම, මොංගෝලියන් සහ අරාබි බත්, චයිනීස් සුප්, නූඩ්ල්ස්, මාළු, ඉස්සො, දැල්ලො සහ සියලුම වර්ගයේ මුහුදු ආහාර |
| ආහාර පාන වෙළඳ කුටි අංක - 05 | ඉන්දියන් කෝනර් | තෝසෙ, ඉඩ්ලි, පූරි, වඩේ, චපාති සහ දකුණු ඉන්දියානු ව්‍යාංජන වර්ග, බිරියානි, නාන්, පරාටා, ෂවරමා, කෙබාබ්ස්, විවිධ වර්ගයේ ඉන්දියානු ව්‍යංජන සහ ඉන්දියානු රස කැවිලි |
| ආහාර පාන වෙළඳ කුටි අංක - 06 | ශ්‍රී ලංකන් ෆුඩ් කෝනර් | ශ්‍රී ලාංකික බත් සහ ව්‍යාංජන, කිරිබත්, පිට්ටු, දේශීය අල වර්ග (මඤ්ඤොක්කා, බතල ආදිය) , කොත්තු, ආප්ප, ඉදි ආප්ප, රොටී, කැඳ, එළවළු සුප්, තේ, ග්‍රෑම් අයිටම් (බැදපු කඩල, මුරුක්කු ආදිය) ,කඩල, කව්පි, මුං ඇට සහ ශ්‍රී ලාංකික රස කැවිලි |
| ආහාර පාන වෙළඳ කුටි අංක - 09 | හෙල්දි සැලඩ් ස්ටෝර් | Low Carb Meals, Keto Meals, Mediterranean Meals, Healthy Classics, Triple Decker Cucumber Sub, Healthy Beverages, English Breakfast, Healthy Desserts, Cheat day Special |
| ආහාර පාන වෙළඳ කුටි අංක - 10 | සෙල්ලම් උපකරණ කුටිය (Teddy Bear Claw Machine) | |

මෙම ආහාර/පාන වර්ග වෙළඳ කුටි අංක 01 හි විකිණීම සඳහා අවසර නොමැත. විකිණීමට හැකි ආහාර වර්ග සම්බන්ධව ඇතිවන ඕනෑම ගැටළුවකදී / මත විමසුමකදී සංස්ථාවේ තීරණය අවසාන තීරණය වනු ඇත.

3.9 ව්‍යාපාරික කටයුතු සිදු කරගෙන යෑම සඳහා අවශ්‍ය මූලික උපකරණ කිසිවක් සංස්ථාව විසින් ලබා නොදෙන අතර, එකී සියළුම උපාංග ටෙන්ඩර්කරු විසින් සපයා ගත යුතුය. එම භාණ්ඩ සඳහා පිරිවැය තෝරාගත් ටෙන්ඩර්කරු විසින් දැරිය යුතුය.

3.10 <u>**අවම මාසික කුලිය**</u>

වෙළඳ කුටි අංක 01 සඳහා අදාළ අවම මාසික කුලිය ඉහත 3.7 වගුවෙහි සඳහන් පරිදි වන අතර, එම මාසික කුලිය සඳහා අදාල බදු ඇතුලත් විය යුතුය (එකතු කළ අගය මත බද්ද). <u>ඉහත සඳහන් වෙළඳ කුටි අංක 01 සඳහා අදාළ අවම මාසික කුලියට වඩා අඩුවෙන් තබා ඇති ලංසු ප්‍රතික්ෂේප වනු ඇත.</u>

READ ONLY

